සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම / විභාග අංකය ................................ කාලය: පැය 02 යි.

### සිංහල භාෂාව හා සාහිත්‍යය - I

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- I කොටසේ ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයා , II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.

- ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) "සිරිපාල යමක් විස්තර කිරීමේ දී කන්ද කෙන්ද කරනවා යැයි" ග්‍රාමෝදයේ සභාපතිතුමා පැවසුවේ ය.

(1) සුළු සිදුවීමක් විශේෂ වර්ණනාවට ලක් කිරීම (2) ප්‍රයෝජනයක් බලාපොරොත්තුවෙන් විස්තර කීම

(3) ලොකු සිදුවීමක් සුළුකොට කියා පෑම (4) රහස් කතාබහට සවන් දී විස්තර කීම

(02) නිවසේ කප්පරක් වැඩ කිරීමට ඇති බව අම්මා පැවසුවා ය.

(1) අවදානම් වැඩක් (2) දුර්ලභ ක්‍රියාවක්

(3) ඉවුම් පිහුම් ප්‍රමාණයක් (4) ඉතා විශාල ප්‍රමාණයක්

- 3 - 4 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර කුමක් ද?

(03) මහාසාර නාට්‍යය ජාතක කථාවක් ඇසුරෙන් කළ හාස්‍යෝත්පාදක නිර්මාණයකි.

(1) සිනහ උපදවන (2) කරුණ රසය ඇති වන

(3) උසුළු විසුළු කරවන (4) දුක උපදවන

(04) සමාජයක ප්‍රගමනයට හේතු වන්නේ එහි වෙසෙන්නන් තුළ පවතින යහපත් ගුණාංගය යි.

(1) බලය (2) ප්‍රගතිය (3) පැතිරුණු (4) ප්‍රසිද්ධ

(05) (අ)ං (අ)ඃ අක්ෂර දෙක;

(1) අනම්‍ය ස්වර දෙකකි. (2) ස්වර දෙකකි.

(3) වර්ගාක්ෂර දෙකකි (4) ව්‍යඤ්ජන අක්ෂර දෙකකි.

(06) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි පද පේළිය කුමක් ද?

(1) සිංහල, ගණිතය, විද්‍යාව, පුරවැසි

(2) පුරවැසි, සිංහල, ගණිතය, විද්‍යාව

(3) ගණිතය, පුරවැසි, විද්‍යාව, සිංහල

(4) විද්‍යාව, ගණිතය, සිංහල, පුරවැසි

(07) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය කුමක් ද?

(1) අනිවාර්ය, මාණවක, ගනුදෙනු, පොලොස්

(2) පෙලපාලි, වර්ෂාව, නිළිය, පරාදීන

(3) ඉගිලෙනවා, ආනමාලු, සම්ප්‍රධාය, ඇතුළත්

(4) කකුල, සෙවණ, වාර්ෂික, නිරෝදායනය

(08) 'හෝ','නොහොත්', 'හෙවත් 'යන නිපාත පදවලින් හැඟවෙන අර්ථය කුමක් ද?

(1) ප්‍රමාණාර්ථය (2) විකල්පාර්ථය (3) භාවාර්ථය (4) විභක්ත්‍යාර්ථය

(09) 'නටවයි' , 'නටද්දී' යන පද කුමන ක්‍රියා වර්ගවලට අයත් ද යන්න පිළිවෙළින් ගැළපූ විට,

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (2) පූර්වක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා , කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

(10) ගුණ - දොස් යන යුගල පද වර්ගීකරණය අනුව,

(1) සමාන යුගල පද

(2) මුල් පදයේ අර්ථය ඇති දෙවන පදයේ අර්ථය නැති යුගල පද

(3) විරුද්ධාර්ථ යුගල පද

(4) සමානරූපී යුගල පද

(11) සිතෙහි උපදින දැඩි ආශාව හඳුන්වන තනි පදය කුමක් ද?

(1) මනදොළ (2) චිත්තාකර්ෂණීය (3) උද්වේග (4) ප්‍රසාද

(12) 'නවකතාකරුවෝ පාඨකයන් පිනවති.' යන වාක්‍යය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වන්නේ,

(1) නවකතාකරුවන් විසින් පාඨකයෝ පිනවති.

(2) නවකතාකරුවන් විසින් පාඨකයෝ පිනවෙති.

(3) නවකතාකරුවන් විසින් පාඨකයෝ පිනවූහ.

(4) නවකතාකරුවන් විසින් පාඨකයෝ පිනවූවෝ ය.

- **13 සිට 16 දක්වා ප්‍රශ්නවලට ගැළපෙන වඩාත් නිවැරදි ව්‍යාකරණානුකූල පදය තෝරන්න.**

(13) ආනන්ද කුමාරස්වාමි මහතා මධ්‍යකාලීන සිංහල කලා ග්‍රන්ථය .......................

(1) ලිව්වා ය. (2) ලිව්වේ ය. (3) ලියන ලදී. (4) ලියූහ.

(14) ....................... මනමේ නාට්‍යය බලා සතුටුවෙති.

(1) ප්‍රේක්ෂකයා (2) ප්‍රේක්ෂකයන් (3) ප්‍රේක්ෂකයෙකු (4) ප්‍රේක්ෂකයෝ

(15) මන්දිදේවිය පලවැල රැගෙන අසපුව කරා ........................

(1) පැමිණියා ය. (2) පැමිණියේ ය. (3) පැමිණියහ. (4) පැමිණෙති.

(16) කොරෝනා නම් රෝගයක් ලොව පුරා .......................

(1) පැතිරුණෝ ය. (2) පැතිර ගියෝ ය. (3) පැතිරුණේ ය. (4) පැතිරුණහ.

(17) "නාට්‍ය ශාස්ත්‍ර" ග්‍රන්ථය රචනා කළේ කවරෙක් ද?

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) භරතමුනි

(3) මහා කවි කාලිදාස (4) ඒ .වී. සුරවීර

(18) .....රෑට පොල්ගස්වල ඇති ඇට්ටි කන්න වඳුරෝ ඇවිත් ද කියලා බලන්න විදානෙ මාමා බැටරිය අල්ලනවා වගේ" මෙම ප්‍රකාශය සම්බන්ධ වන්නේ,

(1) සිරම්බි අඩිය (2) මහල්ලා සහ මුහුද (3) දිට්ඨ දාන (4) මීටර් සීයය

(19) ...ධර්මෙ, රාජසුන්දරම්, වරෙල්ල, අපි ඔක්කොම එකතු වෙලා මේ ලෝකය යහපත් තැනක් කරමු මීට වැඩිය." මෙම උද්ධෘතය ඇතුළත් නිර්මාණයේ කර්තෘ කවරෙක් ද?

(1) විමලරත්න කුමාරගම

(2) ටියුඩර් අමරසේන

(3) මහගමසේකර

(4) ජයලත් මනෝරත්න

(20) කඩු දහයකින් වන රිදුමට වඩා රළු

එක තෙපලකින් වන රිදුමට වෙයි කැකුළු

මනුලොව දුකින් ගලවනු රිසිනම් යහළු

.................................................................

මෙම කවියේ අවසාන පදය වන්නේ,

(1) පිය වදනකින් සනහනු සත් වග සියලු

(2) රටට දැයට වැඩ ඇති දරුවන් තනමු

(3) සුදනන්ගෙන් මෙත් පුරවමු සත සියලු

(4) යුදයට නෙවෙයි කරුණාවට අත් බඳිමු

( ලකුණු $2 \times 20 = 40$ )

# සිංහල භාෂාව හා සාහිත්‍ය - II

**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(01) විවේකය ඵලදායි ලෙස ගත කිරීමේ දී ඔබගේ "ගෙවත්ත වගා කිරීම" සම්බන්ධ ව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) ගෙවත්ත වගාව සඳහා සකස් කර ගත් ආකාරය කෙබඳු ද? (ලකුණු 1)

ii) ඔබ තෝරා ගත් බෝග වර්ග මොනවා ද? (ලකුණු 1)

iii) "ගෙවතු වවමු" මාතෘකා යටතේ ජනතාවට ප්‍රයෝජනවත් ආදර්ශ පාඨ දෙකක් ලියන්න (ලකුණු 2)

iv) විවේකය ඵලදායී ව ගත කිරීමට "ගෙවත්ත වගා කළෙමි" මාතෘකාව යටතේ පැහැදිලි කිරීමක් කරන්න (ලකුණු 2)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන **200 කට නොඅඩු** රචනයක් ලියන්න.

i) ශ්‍රී ලාංකිකයෝ අභියෝග ජය ගැන්මට හපන්නු ය.

ii) රටක් ගොඩනැගීමට මට කළ හැකි දේ

iii) ස්වදේශීය ආහාරවලට මුල්තැන දෙමු

iv) ජන මාධ්‍යයේ වැදගත්කම

v) අගනා ම ස්වාභාවික සම්පත ජලයයි. (ලකුණු 20)

(03) පහත සඳහන් ඡේදය වචන 20- 30 අතර වන සේ සාරාංශ කර ලියන්න. සාරාංශය අග වචන සංඛ්‍යාව ලියන්න.

මෙරට සෙල්ලිපි ඉතිහාසය දෙවන පැතිස් අවධිය දක්වා ඈතට විහිදෙයි. සෙල්ලිපි අතර මුල් වකවානුවේ සිට හත්වන සියවස දක්වා ලියැවී තිබෙන ලිපි එක් ගණයකටත්, එතැන් සිට ලියවී ඇති ලිපි තවත් ගණයකටත් ඒවායේ භාෂා ලක්ෂණ අනුව වෙන් කිරීමට පුළුවන. මිහින්තලේ කණ්ඨක චෛත්‍යය සෙල්ලිපිය මීට උදාහරණ ය. වර්තමාන සිංහල හෝඩිය අද පවතින තත්ත්වයෙන් ම පුරාණයේ නොපැවතුණි. (ලකුණු 10)

(04) පහත සඳහන් කරුණු උපයෝගී කරගෙන බිත්ති පුවත්පතක පළකිරීමට සුදුසු ලිපියක් ලියන්න.

බෝවන රෝග හා බෝ නොවන රෝග පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් ඊයේ දින පැවැත්විණි.

- අරමුණ : නිරෝගී සෞඛ්‍ය සම්පන්න සමාජයක් තැනීම.
- සංවිධානය : රුවන්පුර තරුණ සමාජය
- දේශක : මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා
- වේලාව : පෙ. ව. 8.00 සිට පෙ.ව. 11.00 දක්වා
- වාර්තාකරණය : රුවන්පුර වාර්තාකරු (ලකුණු 10)

(05) පෙළ පොත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

i) 'විරිත් වැකිය' යන ග්‍රන්ථය රචනා කළේ කවරෙක් ද?

ii) ඔබේ පාමුල බැගෑපත් ලෙස
වැටී අයදිමි අහෝ සාමිනි
ජීවිතේ යම් පලක් ඇත් නම්
කිමැයි ඒ මට කියා දුන් මැන...."

මෙම පද්‍යයෙන් වර්ණනාවට ලක් ව ඇත්තේ කුමක් ද?

iii) ලෝක සාමය පවත්වා ගැනීම, පරිසරය විනාශයට එරෙහි පරිගණක වෛරසවලට විරුද්ධ ව මත ඉදිරිපත් කිරීම කළ භෞතික විද්‍යා විද්වතා කවරෙක් ද?

iv) නෑ සර්, සර්ට මේ රාජකාරිය තනියම කර ගන්න අමාරුයි"....
මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද ද? (ලකුණු 1 x 4 = 4)

(06) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රබලතම ආධ්‍යාත්මික බලවේගය වූයේ අවිහිංසාවයි. එතුමා සියලු දෙනාට ම උපදෙස් දුන්නේ ද කිසිවෙකුටවත් ස්වල්ප වූ හෝ හිංසාවක් නොකරන ලෙසට ය. එසේ ම භාරතීය නිදහස් සටන සඳහා ද එතුමා මූලික වශයෙන් පාවිච්චි කළේ මේ අවිහිංසාවාදය ම ය. ඉන්දියාවේ ආර්ථිකය ස්වාධීන කරවීම සඳහා 'චරක ව්‍යාපාරය' නමින් දේශීය කපු පිළි වීවීමේ වැඩසටහනක් ද, ආහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීම සඳහා මහා පරිමාණ කෘෂිකාර්මික ව්‍යාපාරයක් ද ආරම්භ කරනු ලැබීය.

තව ද ශිෂ්‍යයන් තුළ සුචරිතය හා අධ්‍යාත්මික දියුණුව සලසන ආගමික විෂයක් ද ඉගැන්වීම වර්ධා අධ්‍යාපනයේ අවශ්‍ය අංගයක් විය.

i) මහත්මා ගාන්ධිතුමාගේ ප්‍රබලතම ආධ්‍යාත්මික බලවේගය කුමක් ද?
ii) වර්ධා අධ්‍යාපනය යනු කුමක් ද?
iii) දේශීය කපු පිළි වීවීම කුමන නමකින් හැඳින්වූයේ ද?
iv) ආහාරයෙන් රට ස්වයංපෝෂිත කිරීමට එතුමා කළේ කුමක් ද?
v) භාරතීය නිදහස් සටන සඳහා මහත්මා ගාන්ධිතුමා විසින් භාවිත කළේ කුමක් ද?

(ලකුණු 2 x 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 09 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු

### සිංහල භාෂාව හා සාහිත්‍යය - I

| | |
|---|---|
| 1 - 3 | 11 - 1 |
| 2 - 4 | 12 - 2 |
| 3 - 1 | 13 - 2 |
| 4 - 2 | 14 - 4 |
| 5 - 4 | 15 - 1 |
| 6 - 3 | 16 - 3 |
| 7 - 1 | 17 - 2 |
| 8 - 2 | 18 - 4 |
| 9 - 4 | 19 - 3 |
| 10 - 3 | 20 - 1 |

(ලකුණු 2 x 20 = 40)

### සිංහල භාෂාව හා සාහිත්‍යය - II

(01) 01 සිට 04 දක්වා පිළිගත හැකි පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න. (ලකුණු 06)

i) ලකුණු - 01

ii) ලකුණු - 01

iii) ලකුණු - 02

iv) ලකුණු - 02

(02) රචනය -

මාතෘකාවට - ලකුණු - 01

සාරවත් බවට - ලකුණු - 08

සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වාධීනත්වය - ලකුණු - 08

අත් අකුරු, විරාම ලකුණු පද බෙදා ලිවීම - ලකුණු - 03 ( ලකුණු - 20 )

(03) සාරාංශය -

වචන 20 - 30 අතර විය යුතුයි.

අන්තර්ගතය - ලකුණු 06

වචන සීමාව - ලකුණු 02

ශිල්පීය දක්ෂතා - ලකුණු 02 (ලකුණු - 10)

(04) බිත්ති පුවත්පත (ලකුණු - 10)

මාතෘකාව - ලකුණු - 01

බෝවන රෝග - ලකුණු 01

බෝ නොවන රෝග ලකුණු 01

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් - ලකුණු - 01

ඊයේ දින පැවැත්වීම - ලකුණු - 01

අරමුණ - ලකුණු - 01

සංවිධානය - ලකුණු - 01

දේශක - ලකුණු - 01

වේලාව - ලකුණු 01

වාර්තාකරු - ලකුණු - 01

(05) i) කුමාරතුංග මුනිදාස (ලකුණු - 01)
ii) ආර්. එල්. බ්‍රෝහියර් දුටු අවුකන බුදුරුව (ලකුණු - 01)
iii) ස්ටීවන් හෝකින් (ලකුණු - 01)
iv) සුගුණපාල මහතා විසින් මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට (ලකුණු - 01)

(ලකුණු 1 x 4 = 4)

(06) i) අවිහිංසාවාදය

ii) ශිෂ්‍යයන් තුළ සුචරිත හා අධ්‍යාත්මික දියුණුව සලසන ආගමික විෂයයන් ඉගැන්වීම.

iii) චරක ව්‍යාපාරය

iv) මහා පරිමාණ කෘෂිකාර්මික හා ව්‍යාපාර ආරම්භ කිරීම

v) අවිහිංසාවාදය.

(ලකුණු 2 x 5 = 10)